# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)

**ව්‍යාපෘති හැඳුනුම් අංකය : P 505241 ණය අංකය : 7743 LK**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතියෙහි (IRDCRP) පිරිවැය අරභයා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) – ලෝක බැංකුව වෙතින් ණය මුදලක් ලබාගෙන ඇති අතර, එම ණය මුදලින් කොටසක් පහත වගුවේ දක්වා ඇති කොන්ත්‍රාත්තු යටතේ සිදුකරන යෝග්‍ය ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කෙරේ.

2. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් පහත වගුවේ විස්තර කර ඇති ප්‍රසම්පාදනයන් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ප්‍රසම්පාදන අංකය | ප්‍රසම්පාදන විස්තරය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | ලංසු ඇපකර වටිනාකම සහ වලංගු කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | LK-IRDCRP PMU-552114-GO-RFB(NCRTC/HV) | Procurement of High - Value Analytical Instruments for National Cinnamon Research and Training Centre.<br>(HPLC System, FID (Flame Ionization Detector)<br>and Auto sampler for GCMS, Density Meter, Microwave Digester, HF resistant kit for ICPOES | 13,500.00 | රු. 570,000.00<br>2026 දෙසැම්බර් 25 දක්වා වලංගු |
| 2 | LK-IRDCRP PMU-552121-GO-RFB(NCRTC/GL) | Procurement of General Laboratory Equipment for National Cinnamon Research and Training Centre.<br>(Autoclave (50 L),Flame Photometer, Soil Grinder, Water Distiller, Sieve Shaker, -20 °C Freezer,Refrigerator (4 °C)-, Incubator, Laminar Flow Cabinet, Hot Air Oven - Laboratory Oven (400 L) ,Colony Counter (Digital), Compound Microscope, Laboratory Knife Mill,<br>, Vacuum Filtration System, Centrifuge, Analytical Balance -4 decimal points) | 7,500.00 | රු. 275,000.00<br>2026 දෙසැම්බර් 25 දක්වා වලංගු |
| 3 | LK-IRDCRP PMU-552137-GO-RFB(TEA/ HEAVYMET) | Procurement of Heavy Metal Testing Equipment for Sri Lanka Tea Board.<br>(ICP-OES ,Microwave Digestion System,<br>, Acid -resistant Fume Hood) | 9,500.00 | රු. 360,000.00<br>2026 දෙසැම්බර් 25 දක්වා වලංගු |

3. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයැවේ.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP), අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල (දුරකථන: 011 2877 550, 011 2073 044)** වෙතින් ලබාගත හැකි අතර, **2026 ජූලි 10** සිට **2026 ජූලි 31** දක්වා වැඩකරන දිනවල **9.00 පැය සිට 14.00 පැය (ප.ව. 2.00)** දක්වා එම ස්ථානයේදීම ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

5. ආපසු නොගෙවන ගාස්තුව (මුදල සඳහා කරුණාකර ඉහත වගුව බලන්න) මුදලින් පමණක් ගෙවීමෙන් සහ ඉහත අංක 4 විස්තරයේ සඳහන් ලිපිනයෙහි පිහිටි IRDCRP ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වෙත නිල ලිපි ශීර්ෂයක මුල් පිටපතකින් කරන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් **2026 ජූලි 10 සිට 2026 ජූලි 31** දක්වා වැඩකරන දිනවල **09:00 පැය සිට 14:00 පැය (ප.ව. 2.00)** දක්වා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.

6. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු අසාදු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, ලංසු කැඳවීම් ලේඛනයේ ඇති අවශ්‍යතා සපුරාලිය යුතුය.

7. පූර්ව ලංසු රැස්වීමක් **2026 ජූලි 20 වැනි දින 14.00 පැය ට (ප.ව. 2.00)** ඉහත අංක 4 විස්තරයේ සඳහන් ස්ථානයේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඔවුන්ගේම වියදමින් මෙම රැස්වීමට සහභාගි විය හැක.

8. සෑම ප්‍රසම්පාදනයක් සඳහාම වෙන වෙනම, ඉහත වගුවේ සඳහන් වටිනාකම සහ වලංගු දිනය සහිත, ලංසු කැඳවීම් ලේඛනයේ සඳහන් නිර්දේශිත ආකෘතියට අනුව සකස් කරන ලද කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

9. සම්පූර්ණ කරන ලද ලංසු, **2026 ජූලි 31** වැනි දින **14:00 පැය ට (ප.ව. 2.00)** හෝ ඊට පෙර ලැබෙන සේ ඒ සඳහා වෙන් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ "**සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP), අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල**" යන ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය.

10. ලංසු භාර ගැනීම **2026 ජූලි 31** වැනි දින **14:00 පැය ට (ප.ව. 2.00)** අවසන් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, සහභාගි වීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. රජයේ නිවේදනයක් හේතුවෙන් ඉහත සඳහන් කළ ලංසු භාරගැනීම අවසන් කරන දිනයේ කාර්යාලය වසා තැබුවහොත්, ලංසු භාරගැනීම අවසන් කරන දිනය ඊළඟ වහාම එළඹෙන වැඩ කරන දිනය වන අතර, එය එම වේලාවේදීම සහ එම ස්ථානයේදීම විවෘත කෙරේ.

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP),**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**
**දිනය – 2026.07.10**